වගා ආධාර චක්‍රලේඛ අංක: 06

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ 03.
1984.12.06 දින.

මාතෘකාව: **පස සාරවත් කිරීමෙන් තොරව තේ වගා කිරීම නිසා අවලංගුවූ අවසරපත්‍ර වලින් ආවරණය වන තේ ඉඩම් පාළු සැපයීමේ ආධාර ක්‍රමය යටතේ සංවර්ධනය කිරීම**

1:0 **චක්‍රලේඛයේ පරමාර්ථය:**

1:1 තේ නැවත වගා කරන සෑම ඉඩමකම එසේ තේ වැවීමට ප්‍රථම නිර්දේශිත පරිදි පස සාරවත් කිරීම අනිවාර්යයෙන්ම කළ යුත්තකි. ඒ අනුව එයට පටහැනිව ක්‍රියා කර ඇති අවසර පත්‍ර අවලංගු කිරීමට සිදුවී ඇත. එවැනි ඉඩම්වල සහ රබර් X තේ ආධාර ක්‍රමය යටතේ පස සාරවත් නොකර තේ වවා ඇති විට එකී වගාව සාර්ථක ලෙස පිහිටුවා හොඳින් නඩත්තු කර ගෙනවුත් තිබේ නම් එම ඉඩම්වල පාළු සැපයීම සඳහා අධිකාරියෙන් පහසුකම් සැපයීමට ඇති බාධක ඉවත් කිරීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථයයි.

2:0 **ක්‍රියා මාර්ගය:**

2:1 නැවත වගා ආධාර ක්‍රමය යටතේ සහ රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ පස සාරවත් කිරීමෙන් තොරව තේ වැවීම නිසා අවසර පත්‍ර අවලංගුකොට තිබේ නම් සහ එසේ වගා කරන ලද තේ ඉඩම්වල තේ වගාව සාර්ථක ලෙස පිහිටුවා හොඳින් නඩත්තු කර පවත්වාගෙන යන බවට වාර්තා වේ නම් එවැනි අවසර පත්‍ර යටතේ ලබාගෙන ඇති පූර්ව සහනාධාර වාරික (උදුරා දැමීම හා පස සංරක්ෂණය කිරීම වෙනුවෙන්) ආපසු අය නොකරන්න.

2:2 මෙවැනි තේ ඉඩම්වල පස සාරවත් නොකිරීමේ හේතුවෙන් තුන්වන හා ඊට පසු වාරිකයන් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා නොතිබීම නිසා පැල සිටුවීමේ දිනය තහවුරු කරගත නොහැක. එහෙයින් පාළු සැපයීමේ සහනාධාරය සඳහා සුදුසුකම් ලැබීමට හැකි අවම කාල සීමාව වශයෙන් වගාවේ පළමු කප්පාදුව නිම කර තිබීම සෑහෙනු ඇත. (මෙය පළමු කප්පාදුව පිස පැල සෙන්ටර් කිරීමේ දිනය නොවන බව විශේෂයෙන් සළකන්න.) ඒ අනුව දෙවන කප්පාදුවත් සමග පාළු සිටුවීමට හැකි වන පරිදි අවසර දිය හැකිය.

මේ සඳහා එස්.වී.4 මූලික පරීක්ෂණ වාර්තා ආකෘති පත්‍රයේ 1.අ. "වගාවේ වයස" වෙනුවට "වගාව කප්පාදු කර තිබේද?, එසේ නම් කීවෙනි කප්පාදුවද" යන්න පරීක්ෂණ නිලධාරී තැන විසින් වාර්තා කළ යුතුය.

(වී. කේ. නානායක්කාර)
සභාපති.

පිටපත්:
1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
3. සහකාර සාමාන්‍යාධිකාරී(මුදල්)
4. අභ්‍යන්තර විගණක
5. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
6. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී